# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1798/23 – 2013 පෙබරවාරි 19 වැනි අඟහරුවාදා – 2013.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාවිස්ස කෝරළේ සුළු කොට්ඨාසයේ, උනුවින්න ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/පීටීඑච්/2011/383$^{P}$ සහ 2012.06.13 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0031 ක් පමණ වන මාගහයාය නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 1 – මාගහයාය – ප්‍රමාණය: හෙක්. 0.0031 ක් පමණ**

උතුරට: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ශාන්ත මරියා දේවස්ථාන භූමිය සහ ආර්. බී. ආර්. අබේසේකර සහ තවත් අය හිමිකම් කියන මාගහයාය; නැගෙනහිරට: ආර්. බී. ආර්. අබේසේකර සහ තවත් අය හිමිකම් කියන මාගහයාය; දකුණට: මාර්ගය, මහනුවර රදගුරුතුමා හිමිකම් කියන ශාන්ත මරියා දේවස්ථාන භූමිය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ශාන්ත මරියා දේවස්ථාන භූමිය; බටහිරට: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ශාන්ත මරියා දේවස්ථාන භූමිය.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/3/2010/ඩබ්එස්/299.
2013 ජනවාරි මස 04 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 – 373